# අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට

**2022 අතුරු අයවැය තක්සේරුව**

**2023 ජූලි**

**© Verité Research**

# අන්තගර්තය


අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට ........ 3

ඇගයීම් ක්‍රමවේදය ........ 3

විවෘතභාවය ........ 3

ප්‍රගතිය ........ 4

සොයා ගැනීම් විස්තරාත්මකව ........ 6

වගකීම්භරණය ........ 25

# අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට

**"අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට"** යනු අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන ඩැෂ්බෝඩයක් වේ.

2017 වර්ෂයේදී හඳුන්වාදුන් මෙම ඩැෂ්බෝඩය වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම අරමුණු කරගෙන ඇත.

- රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩැෂ්බෝඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

1. රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
2. අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

# ඇගයීම් ක්‍රමවේදය

මෙම ඇගයීමේදී 2022 අතුරු අයවැයෙන් යෝජනා කල වියදම් යෝජනා 24 ක් සහ ප්‍රතිපත්ති යෝජනා 5 ක් ඇගයීමට ලක් කෙරුණි. වියදම් යෝජනා සඳහා ප්‍රතිපාදන සහ ප්‍රමාණාත්මක ප්‍රතිපල තිබුණු අතර ප්‍රතිපත්ති යෝජනා ඵලදායී වීම සඳහා නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) අවශ්‍ය විය.

නිරීක්ෂනය කළ එම සියලු යෝජනා, විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක දෙකක් භාවිතයෙන් ඇගයීමට ලක් කරන ලදී.

පර්යේෂණ කණ්ඩායම මෙම යෝජනා වලට අදාළ තොරතුරු ප්‍රගාමීව අන්තර්ජාලයට එක් කර ඇත්දැයි පරීක්ෂා කළ අතර, මූලික වශයෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වන පනත හරහා නියෝජිතායතනවල ගොනු කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත් වලින් තොරතුරු රැස්කර ගෙන ඇත. මෙම ඉල්ලුම්පත් 2023 ජනවාරි 31 සහ පෙබරවාරි 1 දින වල ඉල්ලීම් ගොනුගත කරන ලදී. රට තුළ පැවති අබර්ධකාරී තත්වය හේතුවෙන්, 2022 දෙසැම්බර් 16 වන තෙක් වැඩ කරන දින 20 ක කාලයක් පුරා නියෝජිතායතන වෙතින් ඇගයීම් සඳහා තොරතුරු භාරගන්නා ලදී. මෙම කාලසීමාවට පසුව ලැබුණු කිසිදු තොරතුරක් ඇගයිම සඳහා සලකා බලනු නොලැබිය.

## විවෘතභාවය

මෙම දර්ශකය රජය විසින් තමන් කුමක් කරන්නේදැයි, පවසන ප්‍රමාණය ඇගයීමකට ලක් කෙරේ. එමගින් එක් එක් යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු රජය විසින් අනාවරණය කිරීමේ මට්ටම මනිනු ලැබේ. කෙටියෙන් ගත් කල මෙම දර්ශකය මගින් විනිවිදභාවය ඇගයීමකට ලක් කෙරේ.

ඇගයීම සිදු කරන වේලාවේ ලැබී ඇති තොරතුරු මත පදනම්ව විවෘතභාවය ඇගයෙන අතර එය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | | |
|---|---|---|
| | ආවෘත | කිසිදු තොරතුරක් නොමැත. |
| | සීමිත | ප්‍රගතිය ඇගයීමට තොරතුරු ප්‍රමාණවත් නොමැත. |

| | |
|---|---|
| උදාසීන | ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. |
| සාධනීය | ප්‍රගතිය පිළිබඳ තොරතුරු අදාල කාලය තුල ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිවිය. |
| විවෘත | පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත. |

## ප්‍රගතිය

මෙම දර්ශකය මගින් රජය තමන් කරන්නේ යැයි පවසන දේ කෙතරම් දුරට ඉටු කරන්නේද යන්න ඇගයීමකට ලක් කරනු ලැබේ. ස්ථාපිත කාල රේඛාවන් සහ සන්ධිස්ථාන මත පදනම්ව යෝජනා සහ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ ලා රජයේ ප්‍රගතිය ඇගයීමට ලක් කරයි.

වියදම් යෝජනා සඳහා ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | |
|---|---|
| ආවෘත | කිසිදු තොරතුරක් නොමැත හෝ ලද තොරතුරු භාවිතා කළ නොහැක |
| කඩ කර ඇත | යෝජනාව පිළිබඳ ප්‍රගතියක් නොමැත හෝ යෝජනාව ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කර ඇත. |
| දුර්වලයි | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 33% ට වඩා අඩුය. |
| අර්ධ සම්පූර්ණයි | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 33%- 66% අතර වේ. |
| සැළකිය යුතුයි | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 66%- 80% අතර වේ. |
| ඉටු කරන ලදි | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඉලක්කයෙන් 80% වැඩි ය. |

ප්‍රතිපත්ති යෝජනා සඳහා ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | |
|---|---|
| හෙළිකර නැත | කිසිදු තොරතුරක් නොමැත හෝ ලද තොරතුරු භාවිතා කළ නොහැක. |
| ක්‍රියාත්මක කර නැත | යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර නොමැත. මේ බව අදාල අමාත්‍යංශය විසින් ලිඛිතව තහවුරු කර ඇත. |
| අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත | යෝජනාවේ ඇතැම් කොටස් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර ඇත. |
| සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත | ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සියලුම කොටස් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර ඇත. තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. |

# සොයා ගැනීම් විස්තරාත්මකව

| යෝජනාව/ අමාත්‍ය මණ්ඩල තීරණය | යෝජනාවේ විස්තර | විවෘතභාවය | ප්‍රගතිය | රජයේ නියෝජිතායතනය |
|---|---|---|---|---|
| | | **විවෘත** | **ඉටු කරන ලදි** | |
| රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනයක් පිහිටුවීම (NAPPP) | රාජ්‍ය හා පෞද්ගලික් අංශයන්ගේ හවුල්කාරිත්වය සහිතව සිදු කළ හැකි ආයෝජන අවස්ථා හඳුනා ගැනීමට හා ආයෝජන දිරි ගැන්වීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනයක් (National Agency for Public-Private Partnership) පිහිටුවීම. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 250 ක් වෙන් කරන මෙන් යෝජනා කරමි. | සීමිත තොරතුරු ප්‍රමාණයක් මාගර්ගතව ප්‍රගාමීව හෙළිදරව් කර ඇත - රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනය ස්ථාපිත කිරීම අනුමත කරන අමාත්‍ය මණ්ඩල තීරණය වෙත ප්‍රවේශ විය හැක, එහෙත් වැඩිදුර විස්තර නොමැත.<br>2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර, ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් ඊට ප්‍රතිචාරයක් ලබා දුන්නේ 2023 පෙබරවාරි 28 දිනැතිව බැවින් එය ප්‍රමාද වූ ප්‍රතිචාරයක් ලෙස වගරීකරණය කරනු ලැබේ. ප්‍රගතිය ඇගයීමට අදාළ සහ ප්‍රයෝජනවත් වන භෞතික සහ මූල්‍ය ප්‍රගතියට අදාළ මතුපිට අගයන් ලබා දෙන ලදි. | 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි දැක්වෙන පරිදි, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනය පිහිටුවීමට අනුමැතිය ලබා දෙන ලදි.<br>තොරතුරු දැනගැනීමේ ඉල්ලීමට ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ලැබුණු ප්‍රතිචාරයට අනුව ක්‍රියාකාරී සැලසුමක් නොලද නමුත් භෞතික සහ මූල්‍ය ප්‍රගතියේ විස්තර ලැබිණි, එය පහත පරිදි විය:<br>ජ්‍යෙෂ්ඨ, විශ්‍රාමලත් බැංකුකරුවකු සහ සමාගම් අධ්‍යක්ෂවරයෙකු වන ආනන්ද ඩබ්. අතුකෝරාළ මහතා 2022.09.14 දින රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනයෙහි සභාපතිවරයා ලෙස පත් කරන ලදි. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අතුකෝරාළ මහතාට පාරිතෝෂිකයක් පිරිනමනු ලැබුව ද ඔහු එය ප්‍රතික්ෂේප කළ අතර දැනට වැටුපක් නොමැතිව ස්වේච්ඡා පදනම මත සේවය කරයි. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනය පිහිටුවීම සහ ඊට මාගෙර්පදේශකත්වය ලබා ගැනීම සඳහා විශේෂඥ දැනුම සහ සහය අපේක්ෂා කරමින් එහි සභාපතිවරයා බහුපාශර්වික නියෝජිතායතන (ADB, IFC සහ ලෝක බැංකුව) සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත.<br>රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනය සහ රජය සතු ව්‍යවයසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ආශ්‍රිත ක්‍රියාකාරකම්වලදී එකිනෙකා සමඟ සම්බන්ධ විය යුතු බැවින්, ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය අත්කර ගැනීම සඳහා නිශ්චිත ව්‍යාපෘති හඳුනාගැනීමේ සාකච්ඡා සිදුවෙමින් පවතී.<br>ඒ හා සමගාමීව, අමාත්‍ය මණ්ඩලය වෙතින් සහ ජනාධිපති ලේකම් කායර්ාලය වෙතින් ලැබෙන යෝජනා සම්බන්ධව ද **රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනය** කටයුතු සිදු කරමින් සිටී.<br>2022 වෂර්යේදී නෙළුම් කුළුණ ගොඩනැඟිල්ලේ වෙන් කර තිබූ කායර්ාලයක් අළුත්වැඩියා කිරීම සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 2.2ක් යොදවා ඇත. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනය දැනට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කායර්ාලය සහ ජනාධිපති ලේකම් කායර්ාලය හරහා ලැබෙන සන්නිවේදනයන් පසු විපරම් කරමින් සිටී. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| වගා හානි සඳහා මුදල් ගෙවීම | පසුගිය කාලය තුළ ගොවීන්ගේ අස්වැන්න අඩු | **ආවෘත** | **හෙළිදරවු කර නොමැත** | සංවධර්න මූල්‍ය දෙපාතර්මේන්තුව |

| | | | | |
|---|---|---|---|---|
| | වීම, පොහොර, කෘමිනාශක හා යෙදවුම්වල හිඟය, වගා කිරීම අත්හැරීම ආදිය හේතුවෙන් කුඹුරු හෙක්ටයාර් 2 ක් හෝ ඊට අඩුවෙන් වී වගා කිරීම සඳහා රාජ්‍ය බැංකු වෙතින් ලබා ගත් වගා ණය ගෙවීම අපහසු වී ගෙවීම් හිඟ හිට ඇති කුඩා පරිමාණ ගොවීන්ගේ සංඛ්‍යාව 2022 මැයි මස 31 දින වන විට 28,259 ක් ලෙස වාතර්ා වී තිබේ. ගොවීන්ගේ ආථර්ික ශක්තිය වැඩි කිරීම හා ඔවුන් ණය බරින් මුදවා ගැනීම අරමුණු කොට ගෙන දැනට රාජ්‍ය බැංකු වෙත ගෙවීම් පැහැර හැර ඇති හිඟ ණය මුදල වන රු. මිලියන 688 ක මුදල (පොළිය හැර) කපා හැරීමට අපි ක්‍රියා කරන්නෙමු. එසේ කපා හැරීමට නියමිත මුදල් මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහයට පීඩනයක් නොවන ආකාරයට වසර දෙකක් තුළ අදියර වශයෙන් අදාළ බැංකු වෙත ලබා දෙනු ඇත. ඒ අනුව, එම ණය මුදල්වලට අදාළ පොළිය අදාළ බැංකු විසින් කපා හැරීමට කටයුතු කළ යුතු ය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා මම රු. මිලියන 350 ක් වෙන් කරමි. | තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් 2023 පෙබරවාරි 01 දින ගොනු කරනු ලැබුව ද, පසු විපරම් ගණනාවක් සිදු කළ ද ක්‍රියාත්මක කරන ආයතනයෙන් ඊට ප්‍රතිචාරයක් නොලැබුණි. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | |
| | | **සාධනීය** | **දුවර්ලයි** | |

| | | | | |
|---|---|---|---|---|
| යොවුන් කෘෂිකාමරික සමාගම් පිහිටුවීම | කෘෂිකමර්ාන්තය සහ ව්‍යවසායකත්වය ඒකාබද්ධ වන බව අප විසින් තහවුරු කළ යුතුය. අප ගැටලු තේරුම් ගෙන අපගේ කෘෂිකමර්ාන්තය ප්‍රවධර්නය කිරීමට නැවත සිතීමට වගබලා ගත යුතුව ඇත. තරුණ පරපුර නව තාක්‍ෂණ ක්‍රම භාවිතා කිරීමට උත්සුක වෙති. ඔවුන්ට නව්‍ය මෙවලම් භාවිත කළ හැකි අතර අගය දාමය හරහා කායර්ක්ෂමතාව වැඩි දියුණු කිරීමේ හැකියාව ඇත. මෙම සන්දභර්ය තුළ, උපරිම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා යෞවන කෘෂි සමාගම් පිහිටුවීමට සහ එම සමාගම් සමාජ ප්‍රාදේශීය සම්මේලන 331 සමග සම්බන්ධ කිරීමට මම යෝජනා කරමි. මෙම යෝජනාව සඳහා රු. මිලියන 250 ක් වෙන් කෙරෙනු ඇත. | තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් 2023 පෙබරවාරි 01 දින ගොනු කරනු ලැබුව ද, ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ඊට ප්‍රතිචාරයක් ලැබුණේ 2023 මාතර්ු 10 දිනැතිව නිසා එය ප්‍රමාද වූ ප්‍රතිචාරයක් ලෙස වගර්ීකරණය කෙරේ. මේ හරහා ක්‍රියාකාරී සැලැස්මක් සහ ඉලක්ක සපයා ඇතත්, වාතර්ා කිරීමට ප්‍රගතියක් නොමැති බව පෙනේ. | ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් තොරතුරු දැනගැනීමේ ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරයට අනුව, ව්‍යාපෘතිය උපායමාගර්ිකව සකස් කර ඇති අතර වසර 5ක කාලයක් සඳහා ඉලක්ක සකස් කර ඇත. කෙසේ වෙතත් ඉදිරිපත් කර ඇති තොරතුරුවලින් පෙනී යන්නේ යෝජනාව සැබවින්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ලබා නොමැති බවයි. | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය |
| දේශීය කිරි නිෂ්පාදනය ප්‍රවධර්නය කිරීම | දේශීය කිරි නිෂ්පාදනය නංවාලීම සඳහා ශක්තිමත් වැඩපිළිවෙලක් අවශ්‍ය වේ. ඒ නිසා, සියළු පාශර්වකරුවන්ගේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා රජය හෝ සංවධර්න පාශර්වකරුවන්ගේ අරමුදල් යොදා ගනු ලබන ව්‍යාපෘතියක් මගින් ජාතික මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. කඳුකර දේශගුණය තුළ ඵලදායිතාවය ඉහළ බැවින්, උපයෝජනය නොකළ හෝ අඩු ඵලදායිතාවයෙන් යුතු වතු මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගත හැක. මූලිකව මේ සඳහා රු. මිලියන 200 ක් | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් 2023 පෙබරවාරි 01 දින ගොනු කරනු ලැබුව ද, පසු විපරම් ගණනාවක් සිදු කළ ද ක්‍රියාත්මක කරන ආයතනයෙන් ඊට ප්‍රතිචාරයක් නොලැබුණි. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි 13 වන දින කෘෂිකමර් අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ලැබුණු බව ලිඛිතව දන්වන ලදි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | කෘෂිකමර් අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| | වෙන් කිරීමට මම යෝජනා කරමි. | | | |
| ගොවියන්ට බීජ සහ රෝපණ ද්‍රව්‍ය සැපයීම | පසුගිය කාලය තුළ වගා කරන ලද බිම් ප්‍රමාණය හා අස්වැන්න අඩුවීම හේතුවෙන් බීජ හා රෝපණ ද්‍රව්‍යවල හිඟයක් පවතින බැවින් ගොවීන් වෙත අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීමට හැකිවන පරිදි කෘෂිකමර් දෙපාතර්මේන්තුව හා රජයේ ගොවිපළවල් විසින් කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු ය. ඒ අනුව, අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා කෘෂිකමර් දෙපාතර්මේන්තුව වෙත රු. මිලියන 400 ක් වෙන් කිරීමට යෝජනා කරමි. | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර, එම දෙපාතර්මේන්තුවේම වෙනත් තොරතුරු නිලධාරියෙකුගේ විෂය පථයට අයත් වන බැවින් ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව දන්වමින් 2023 පෙබරවාරි 14 දිනැති ප්‍රතිචාරයක් ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලැබිණි | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | කෘෂිකමර් දෙපාතර්මේන්තුව |
| රජයේ ඉඩම් ඵලදායිව භාවිතා කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් යොදා ගැනීම | රාජ්‍ය අංශයේ ඇති ඉඩම් කායර්ක්ෂමව හා ඵලදායි ලෙස කෘෂිකාමරීක හා සත්ත්ව පාලන කටයුතුවල යෙදවීමේ අරමුණින් සහ අපනයන පාදක කොටගත් කෘෂිකමර්ාන්තය දිරි ගැන්වීමේ මූලෝපාය යටතේ රජය සතුව දැනට පවතින ඉඩම් කායර්ක්ෂමව යෙදවීමට රැකියා විරහිත තරුණ පිරිස් ඒ සඳහා යොදවා ගැනීමට කටයුතු කෙරෙනු ඇත. ඒ අනුව, හඳුනාගනු ලබන ඉඩම් පිහිටි ප්‍රදේශයේ දැනට රැකියා විරහිත තරුණ කණ්ඩායම් (යටත් පිරිසෙයින් 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම්) වෙත අක්කර 20 කින් සමන්විත බිම් කොටස් වෙන් | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර, එම යෝජනාව තමන් සතු නොවන සහ තම පාලනය යටතේ නොපවතින බැවින් එය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් 2023 පෙබරවාරි 22 දිනැති ප්‍රතිචාරයක් එවන ලදි, (සටහන: මුල් තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කරන ලද්දේ ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය මත පදනම්ව ය.) | **හෙළිදරව් කර නොමැත**<br>ක්‍රියාත්මක කිරීමේ ආයතනය පැහැදිලිව හඳුනාගෙන නොමැති බැවින් කිසිදු තොරතුරක් සපයා නොමැති අතර, යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි තොරතුරු අන්තජර්ාලයේ ද පළ කර නොමැත. | හඳුනා ගෙන නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | කර එම ඉඩම් කෘෂිකාමරීක හා සත්ත්ව පාලන ව්‍යවසායයන් සඳහා ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 50 ක් වෙන් කරමි. | | | |
| අළුතින් අරඹන ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කරමින් පයෙර්ෂණ සහ සංවධර්නය ප්‍රවධර්නය කිරීම සහ වාණිජකරණය කිරීම | සාථර්කත්වය ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාව ගෝලීය තරඟකාරී ශ්‍රේණිගතකිරීම් තුළ ඉහළ නැංවීම සඳහා පයෙර්ෂණ සහ සංවධර්න අංශය වැඩිදියුණු කිරීම වැදගත් වේ. එම නිසා, විශේෂයෙන් නව ව්‍යාපාර ඇරඹීමේ සංස්කෘතියක් සමඟ පයෙර්ෂණ හා සංවධර්නය ප්‍රවධර්නය කිරීම සහ වාණිජකරණය කිරීම සඳහා දේශීය විශ්ව විද්‍යාල සහ තාක්ෂණික ආයතනවල ද සහය ඇතිව යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට රු. මිලියන 100 ක් වෙන් කිරීමට මම යෝජනා කරමි. | **ආවෘත**<br><br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් 2023 පෙබරවාරි 01 දින ගොනු කරන ලදි, පසු විපරම් ගණනාවක් සිදු කළ ද ක්‍රියාත්මක කරන ආයතනයෙන් ප්‍රතිචාරයක් නොලැබිණි. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි 22 දිනැති ලිපියක් මගින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ලැබුණු බව ලිඛිතව දන්වන ලදි. | **හෙළිදරව් කර නොමැත**<br><br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| දේශීය ඇසුරුම් නිෂ්පාදන ප්‍රවධර්නය | රට තුළ නිෂ්පාදනය කරන කෘෂිකාමරීක බෝගවල අලෙවිය සහ කල් පැවැත්ම වැඩි දියුණු කිරීම මගින් කෘෂිකාමරීක නිෂ්පාදනවල අපතේ යාම අඩු කිරීම අවශ්‍ය වේ. එබැවින් කෘෂිකාමරීක නිෂ්පාදන කල් තබා ගැනීම සහ අලෙවි කර ගැනීම සඳහා දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන සිදු කරන ආහාර ඇසුරුම් කිරීමේ කමර්ාන්ත ප්‍රවධර්නය කිරීම සිදු කළ යුතු ය. ආහාර ඇසුරුම් සකස් කිරීම සඳහා උසස් නව තාක්ෂණය සහිත උපකරණ/උපාංග ආනයනය කිරීමේ දී 50% ක තීරු බදු සහනයක් ලබා දෙනු ඇත. | **සාධනීය**<br><br>අපනයන සංවධර්න මණ්ඩලය විසින් ප්‍රගාමීව ඇතැම් තොරතුරු මාගර්ගතව හෙළිදරව් කර තිබේ - දේශීය ඇසුරුම් නිෂ්පාදන ප්‍රවධර්නය පිළිබඳව අතුරු අයවැයේ ඇතුළත් යෝජනා අංක 32 ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (ආථරීක කටයුතු) ගේ ප්‍රධානත්වයෙන් 2022 සැප්තැම්බර් 28 දින ජනාධිපති ලේකම් කායර්ාලයේදී පවත්වන ලද රැස්වීමකදී මීට අදාළ ඉදිරි සැලසුම් පිළිබඳව සාකච්ඡා කරන ලදි.<br>2022 නොවැම්බර් 18 සිට 20 දක්වා BMICH හි පැවති Profood, Propack and Ag-biz 2022 ප්‍රදශර්නයට ඇතුළත් කර තිබූ ජාතික ඇසුරුම් මණ්ඩපය බොහෝ නරඹන්නන් ආකෂර්ණය කර ගත්තේය. එමෙන්ම, ඒ හරහා කමර්ාන්ත | **දුවර්ලයි**<br><br>ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් තොරතුරු දැනගැනීමේ ඉල්ලීමට දක්වන ලද ප්‍රතිචාරයෙහි දක්වා ඇති පරිදි, සංශෝධිත ප්‍රතිපාදන මිලියන 26.84 න් අපනයන සංවධර්න මණ්ඩලය වෙත ලැබී ඇත්තේ රු මිලියන 5.7 ක් පමණි. අරමුදල් පහත අරමුණු සඳහා යොදවන ලදි: (1) Profood and Propack ප්‍රදශර්නයේදී ජාතික ඇසුරුම් මණ්ඩපය සඳහා සහ (2) ඇසුරුම් ආශ්‍රිත ව්‍යාපෘතිවල ජාතික සම්බන්ධීකරණ ආයතනය ලෙස ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC) යළි ක්‍රියාත්මක කිරීම සඳහා. | අපනයන සංවධර්න මණ්ඩලය |

| | | | | |
|---|---|---|---|---|
| | මෙයට අමතරව, තල් සංවර්ධන මණ්ඩලය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව නව ඇසුරුම් හඳුන්වා දීම හා ආකර්ෂණීය ඇසුරුම් මගින් වෙළෙඳපොළ ප්‍රවර්ධනයට දායකත්වය ලබා දීම සිදු කළ යුතු ය. මේ සඳහා අතිරේකව රු. මිලියන 250 ක් වෙන් කරමි. | අමාත්‍යාංශය, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ රාජ්‍ය ආයතන එකොළහක් අතර පැවති සහයෝගිතාව මෙන්ම ඇසුරුම්කරණ කමර්ාන්තයට ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය තුළින් ලද හැකි සේවාවන් ද ප්‍රදශර්නය කරන ලදි.<br>තල් සංවර්ධන මණ්ඩලය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාමරීක තාක්ෂණ ආයතනය, කාමරීක සංවර්ධන මණ්ඩලය, ජාතික ඉංජිනේරු පයෙර්ෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා පසු අස්වනු තාක්ෂණ ආයතනය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය එම මණ්ඩපයේදී එක්ව කටයුතු කරමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අගය එකතු කළ ඇසුරුම් සේවා පිළිබඳ මෙවලම් සහ දැනුම ලබා දීම සඳහා සම්මන්ත්‍රණ මාලාවක් ද පැවැත්වීය.<br><br>2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර, ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් 2023 පෙබරවාරි 15 දිනැති ප්‍රතිචාරයක් යොමු කරන ලදි. ප්‍රගති තක්සේරුවක් පැවැත්වීමට අදාළ සහ ප්‍රයෝජනවත් තොරතුරු ඉන් ලබා දෙන ලදි. | | |
| සංචාරක ප්‍රවර්ධනය ආශ්‍රිත කටයුතු ක්‍රියාත්මක කිරීම | මේ වසරේ සැප්තැම්බර් මාසයේ සිට සංචාරකයින් වැඩි වශයෙන් ආකෂර්ණය කර ගැනීම සඳහා සංචාරක අමාත්‍යාංශය විසින් සංචාරක මණ්ඩලයේ සහ සංචාරක කමර්ාන්තයට සම්බන්ධ අනෙකුත් ආයතනවල සහය ඇතිව විශේෂ වැඩසටහන් සංවිධානය කළ යුතු ය. මෙහිදී ඉදිරියේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත විවිධ ජාතීන්ට අනන්‍ය වූ සංස්කෘතික/ආගමික උත්සව ඉලක්ක කර ගැනීම අවශ්‍ය වේ. මෙම කමර්ාන්තයේ ඇති වැදගත්කම සැලකිල්ලට | **සාධනීය** | **දුවර්ලයි** | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය |
| | | තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් 2023 පෙබරවාරි 01 දින ගොනු කරන ලද අතර 2023 පෙබරවාරි 15 දිනැති ප්‍රතිචාරයක් ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලැබුණි. ප්‍රගතිය තක්සේරු කිරීමට අදාළ සහ ප්‍රයෝජනවත් තොරතුරු ඉන් සපයන ලදි. | ක්‍රියාත්මක කිරීමේ ආයතනය තොරතුරු දැනගැනීමේ ඉල්ලීමට දක්වන ලද ප්‍රතිචාරයට අනුව, වැඩි සංචාරකයින් පිරිසක් ආකෂර්ණය කර ගැනීම සඳහා විශේෂ වැඩසටහනක් සකස් කිරීම සඳහා සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලද අතර (විස්තර ලබා දී ඇත) කමිටුව විසින් ඒ සඳහා විශේෂ වැඩසටහනක් සකස් කර ඇත. කෙසේ වෙතත් අරමුදල් මඳ වීම හේතුවෙන් මෙම වැඩසටහන මේ වන තෙක් ක්‍රියාත්මක කර නොමැත. | |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙන 2023 වෂර්ය අවසන් වන විට වසරකට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව ලක්ෂ 25 දක්වා වැඩි කර ගැනීම ඉලක්කය ලෙස ගෙන ක්‍රියා කළ යුතු ය. මීට අමතරව, ඉහළ වියදම් දැරීමේ හැකියාවක් ඇති සංචාරකයින් ආකෂර්ණය කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. එමෙන්ම සංචාරක ආකෂර්ණයන් සහිත නව ස්ථාන හඳුනාගැනීම සහ ඒ ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳව අවධානය යොමුකර වාතර්ාවක් ඉදිරිපත් කිරීම සඳහා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පුද්ගලයින් පස් දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතු අතර ඉදිරි ක්‍රියාමාගර් සඳහා ඔවුන්ගේ නිදෙර්ශ ඇතුළත් වාතර්ාවක් මාසයක් ඉකුත් වන තැන ඉදිරිපත් කළ යුතු ය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 300 ක් වෙන් කරන ලෙස මම යෝජනා කරමි. | | | |
| පෙර පුහුණුවක් නොමැති සේවා නියුක්තිකයින් හට තෝරාගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව සහ සුදුසුකම් ලබා දීම | ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තුළ කිසිදු පෙර පුහුණුවක් නොමැතිව රැකියාවේ යෙදී රැකියාව තුළින් නිපුණතා ලබාගෙන රැකියාවල නිරත වන විශාල පිරිසක් සිටී. මෙම පිරිසට අදාළ න්‍යායික දැනුම ඇතුළු වැඩිදුර පුහුණුවක් සහ සුදුසුකම් ලබා දීමේ අවශ්‍යතාවක් පවතී. මේ හරහා රැකියාවල ඵලදායිතාව වධර්නය වන අතර, දක්ෂ කායර් මණ්ඩලයක් බිහි කරගැනීම තුළින් ගෝලීය | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එම ඉල්ලීම 2023 පෙබරවාරි 22 වන දින රාජ්‍ය අමාත්‍යාංශයට මාරු කර යවන ලදි. ඉන්පසු ඒ පිළිබඳව කිසිදු සන්නිවේදනයක් නොලැබිණි | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | නිපුණතා සංවධර්න, වෘත්තීය අධ්‍යාපන, පයෙර්ෂණ සහ නව නිපැයුම් පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| | වශයෙන් තරඟකාරී මට්ටමකට එළැඹීමට ව්‍යාපාරවලට හැකි වේ. එමෙන්ම රැකියා අපේක්ෂකයින්ට වඩාත් ඵලදායි රැකියා අවස්ථා මෙන්ම විදේශ රැකියා අවස්ථා ද සොයා ගැනීමට හැකි වනු ඇත. කොවිඩ් -19 වසංගතයේ අයහපත් බලපෑම සහ ආර්ථික අවපාතයේ ප්‍රතිඵලයක් ලෙස, රැකියා අහිමි වන පුද්ගලයින් සිටින බැවින් නව රැකියා අවස්ථා සඳහා ඔවුන් පුහුණු කිරීමේ අවශ්‍යතාවක් පවතී. ග්‍රාමීය ප්‍රදේශවලින් නිදහස් වෙළඳ කලාපයේ කමර්ාන්තශාලාවල සේවයට පැමිණෙන සහය සේවා සපයන කායර් මණ්ඩලය වසර පහක පමණ කාලයක් සේවය කිරීමෙන් පසු නැවත ගම්බිම් බලා යාමට පෙළඹේ. මෙහිදී බොහෝ විට කාන්තාවන්ට රැකියා අවස්ථා අහිමි වන අතර පිරිමි අවිධිමත් රැකියාවල නිරත වෙති. ඒ අනුව නිදහස් වෙළෙඳ කලාපවල නියැළී සිටි රැකියා තුළින් ලබා ගන්නා කුසලතා මත නව රැකියාවක් ලබා ගැනීමට හැකි වන පරිදි වැඩිදුර පුහුණුව ලබා දීම අවශ්‍ය වේ. ඒ අනුව තෝරාගත් වෘත්තීය පුහුණු ආයතන (යෞවන සේනාංක, වෘත්තීය  පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය) සහ වෘත්තීය පුහුණු අංශයේ නියාමන ආයතනය වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | | | |

| | | | | |
|---|---|---|---|---|
| | මගින් ඔවුන් පුහුණු කර ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබාදීමට මෙම ක්‍රමය යටතේ හැකියාව ලැබේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 200 ක් වෙන් කරන ලෙස මම යෝජනා කරමි. | | | |
| සැපයුම් දාමය වඩාත් කාර්යක්ෂම කිරීමට එළවලු සහ පළතුරු ප්‍රවාහනය සඳහා දුම්රිය පහසුකම් භාවිතා කිරීම | උඩරට ප්‍රදේශවල සිට කොළඹ සහ නාගරික ප්‍රදේශවලට නැවුම් බව රැක ගනිමින් එළවලු, පළතුරු, මල් සහ තේ නිෂ්පාදන ප්‍රවාහනය කිරීම ගොවියාට, නිෂ්පාදකයාට, වෙළෙඳ ප්‍රජාවට මෙන්ම පාරිභෝගිකයාටද වැදගත් වේ. එබැවින් දුම්රිය මාගර්යෙන් මෙම භාණ්ඩ ප්‍රවාහනය කිරීම දිරිමත් කිරීම අවශ්‍යව ඇත. මේ හරහා නාස්තිය, ප්‍රමාදය සහ වියදම් අවම කර ගත හැකි අතර අමතර ආදායමක් ශ්‍රී ලංකා දුම්රිය සේවයට ලැබෙනු ඇත. මීට ආරම්භයක් ලෙස හාලිඇල දුම්රිය ස්ථානයේ සිට කොළඹ කොටුව දුම්රිය ස්ථානය දක්වා එළවලු, පළතුරු ඇතුළු නිෂ්පාදන ප්‍රවාහනය කිරීමට අදාළ පහසුකම් සහිත දුම්රියක් යෙදවිය යුතුය. මේ සඳහා අදාළ දුම්රිය ස්ථානවල භාණ්ඩ පැටවීමේ පහසුකම් වැඩිදියුණු කළ යුතු අතර සමුපකාර හා පෞද්ගලික ව්‍යවසායකයන්ගේ සහභාගිත්වයෙන් භාණ්ඩ එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා එම මධ්‍යස්ථානවල සිට අදාළ දුම්රිය ස්ථාන වෙත ප්‍රවාහන පහසුකම් සැලසීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ | **ආවෘත** | **හෙළිදරව් කර නොමැත** | දුම්රිය දෙපාතර්මේන්තුව |
| | | තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර පසු විපරම් කිරීම් ගණනාවක් සිදු කළ ද කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | |

| | | | | |
|---|---|---|---|---|
| | යුතුය. කොළඹ සිට බදුල්ල දක්වා භාණ්ඩ ප්‍රවාහනය කිරීමට තොග වෙළෙන්දන් දිරිමත් කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා දුම්රිය සේවය කටයුතු කළ යුතු ය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 200 ක් වෙන් කරන ලෙස මම යෝජනා කරමි. | | | |
| මාසික සමෘද්ධි දීමනාව | මාසික සමෘද්ධි දීමනාව<br>දැනට ලැබෙන සහනය - රු. 420/- සිට රු. 4,500/- දක්වා මාසික දීමනාව<br>මීළඟ මාස 04 සඳහා යෝජිත මාසික දීමනා - රු. 3,000/- ක අවම මාසික ගෙවීමක සිට රු. 3,100/- ක උපරිමයක් දක්වා | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත් එම ඉල්ලීම මාරු කර යවන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | සමෘද්ධි සංවධර්න දෙපාතර්මේන්තුව |
| වැඩිහිටියන් සඳහා දීමනාව | වැඩිහිටියන් සඳහා දීමනාව<br>දැනට ලැබෙන සහනය - අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන්ට රු. 2,000/- ක මාසික දීමනාවක් සහ වයස අවුරුදු 100 ට වැඩි අයට රු. 5,000/- ක මාසික දීමනාවක්.<br>මීළඟ මාස 04 සඳහා යෝජිත දීමනාව - අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන්ට රු. 3,000/- ක මාසික දීමනාවක් සහ වයස අවුරුදු 100 ට වැඩි වැඩිහිටයන් සඳහා රු. 2,500/- ක මාසික දීමනාවක් | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත් එම ඉල්ලීම මාරු කර යවන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය |
| අඩු ආදායම්ලාභී අබාධිත පුද්ගලයින් සඳහා සහය | අඩු ආදායම්ලාභී අබාධිත පුද්ගලයින් සඳහා සහය<br>දැනට ලැබෙන දීමනාව -. රු. 5,000/- බැගින්<br>මීළඟ මාස 04 සඳහා | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| | යෝජිත දීමනාව - රු. 2,500/- මාසික ගෙවීමක් | වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත් එම ඉල්ලීම මාරු කර යවන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | | |
| වකුගඩු රෝගීන් සඳහා දීමනාව | වකුගඩු රෝගීන් සඳහා දීමනාව<br>දැනට ලැබෙන සහනය -. රු. 5,000/-<br>ඊළඟ මාස 04 සඳහා යෝජිත දීමනාව - රු. 2,500/- මාසික ගෙවීමක් | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත් එම ඉල්ලීම මාරු කර යවන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය |
| ආථර්ික දුෂ්කරතා මත පීඩාවට පත් ජනතාව සඳහා සහන (දැනට සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත හෝ වකුගඩු දීමනා නොලබන නමුත් පොරොත්තු ලේඛනවල සිටින අය සඳහා දීමනාව) | ආථර්ික දුෂ්කරතා මත පීඩාවට පත් ජනතාව සඳහා සහන (දැනට සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත හෝ වකුගඩු දීමනා නොලබන නමුත් පොරොත්තු ලේඛනවල සිටින අය සඳහා දීමනාව)<br>දැනට ලැබෙන සහනය -. මැයි, ජූනි සහ ජූලි මාස සඳහා රු. 5,000/ බැගින් ලබා දෙන ලදි<br>ඊළඟ මාස 04 සඳහා යෝජිත දීමනාව - තවත් මාස් 4 ක කාලයක් සඳහා රු. 5,000/- ක ගෙවීමක් | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත් එම ඉල්ලීම මාරු කර යවන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය |
| ගභර්ණී මව්වරුන් සඳහා පෝෂණීය ආහාර පැකේජය | ගභර්ණී මව්වරුන් සඳහා පෝෂණීය ආහාර පැකේජය දැනට ලැබෙන සහනය -. රු. 20,00 ක දීමනාවක් ගෙවනු ලැබේ<br>ඊළඟ මාස 04 සඳහා යෝජිත දීමනාව - රු. 2,500/- මාසික ගෙවීමක් | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත් එම ඉල්ලීම මාරු කර යවන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා කිසිදු තොරතුරක් ලබා නොදුන් අතර අන්තජර්ාලයෙන් ලබාගැනීමට නොහැකි විය. | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| | | **සාධනීය** | **අධර් සම්පූණර්යි** | |
| කඩිනමින් සහන සැලසීම සඳහා හඳුනාගත් පවුල් | කඩිනමින් සහන සැලසීම සඳහා හඳුනාගත් පවුල් මීළඟ මාස 04 සඳහා යෝජිත දීමනාව - රු. 10,000 ක මාසික ගෙවීමක් | තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර එම ඉල්ලීම ජනාධිපති ලේකම් කායර්ාලය වෙත මාරු කර යවන ලදි. කෙසේ වෙතත් මුල් ආයතනය විසින් ද ප්‍රගතිය තක්සේරු කිරීමට අදාළ තොරතුරු සපයන ලදි. | ක්රියාත්මක කිරීමේ ආයතනය තොරතුරු දැනගැනීමේ ඉල්ලීමට ලබා දුන් ප්රතිචාරයට අනුව, භෞතික හා මූල්ය ප්රගතිය යන දෙකම 58.6% ක් වේ. | ජනාධිපති ලේකම් කායර්ාලය |
| | | **උදාසීන** | **සැළකිය යුතුයි** | |
| රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය | රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමට පහසුකම් සැලසීම සඳහා "රජය සතු ව්‍යසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය" පිහිටුවීමට යෝජිතය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 200 ක් වෙන් කරන ලෙස මම යෝජනා කරමි. | සීමිත තොරුතුර ප්‍රමාණයක් ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර තිබේ.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර එය එම දෙපාතර්මේන්තුව අයත් අමාත්‍යාංශයට යොමු කරන ලදි. 2023 මාතර්‍ 24 දින විද්‍යුත් තැපැල් මාගර්යෙන් ඊට ප්‍රතිචාරයක් ලැබිණි. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි.<br>රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ ප්‍රධානියා ලෙස පත් කරන ලද සුරේෂ් ෂා මහතා වෙතින් ලද විද්‍යුත් තැපැල් පණිවිඩයේ සඳහන් තොරතුරුවලට අනුව යෝජනාවේ ප්‍රගතිය පහත පරිදි වේ:<br>1. රජය සතු ව්‍යවසායයන් සඳහා ප්‍රතිපත්තියක් කෙටුම්පත් කර ඇති අතර දැනට ලෝක බැංකුවේ සහය ඇතිව එය සම්පූණර් කරමින් සිටී. මෙය අප්‍රේල් අළුත් අවුරුද්දට පෙර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා සභාගත කිරීමට නියමිත ය.<br>2. රජය සතු ව්‍යවසායයන්වලට අදාළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සහ මෙතැන් සිට රජය සතු ව්‍යවසායයන් කළමනාකරණය කිරීමට පරිපාලක සමාගමක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි. සමාගමේ ව්‍යවස්ථාව සූදානම් වූ පසු මෙම සමාගම පිහිටවනු ඇත. ලෝක බැංකුවේ තාක්ෂණික සහය ඇතිව මෙම ව්‍යවස්ථාව කෙටුම්පත් කෙරෙමින් ඇත.<br>3. ආයතන 8ක් අත් හැරීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් අප අනුගමනය කිරීමට අපේක්ෂා කරන ක්‍රියාවලිය ද ඇතුළුව ඒ පිළිබඳ විස්තර ප්‍රසිද්ධ කර ඇත.<br>4. අපගේ වියදම් ඉතා අවම වන අතර මම ඇතුළු කමිටු සාමාජිකයෝ මහජන සුබසෙත පතා මුදල් අය නොකරමින් කටයුතු කරමින් සිටිමු.<br>වතර්මානයේ වැටුප් ලබන කායර් මණ්ඩලය 6 කි. අපගේ කායර්ාලය රාජ්‍ය කායර්ාල සංකීණර්යක් වන අරලිය ගහ මන්දිරයේ ස්ථාපිත ය.<br>ලබා දී ඇති තොරතුරු මගින් වෙන් කරන ලද අරමුදල්වල මූල්‍ය ප්‍රගතිය හෙළි නොකෙරේ. කෙසේ වෙතත්, රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය පිහිටුවීම සම්බන්ධයෙන් අත්කර ගෙන ඇති ප්‍රගතිය තක්සේරු කිරීමට මෙය ප්‍රමාණවත් වේ. | මුදල් අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| දේශීය කෘෂිකාමරීක සංවධර්න (DAD) අගය දාම වැඩසටහන ශක්තිමත් කිරීම | කෘෂිකාමරීක අගය දාමයන් ද සංවධර්නය කිරීම වැදගත් ය. මෙම අරමුණ සඳහා දේශීය කෘෂිකමර් සංවධර්න (DAD) අගය දාම වැඩසටහන ශක්තිමත් කළ යුතු බවට මම යෝජනා කරමි. ශ්‍රී ලංකා මහ බැංකුව ස්වකීය අරමුදල් (රු. බිලියන 1 ක්) යොදාගනිමින් දේශීය කෘෂිකාමරීක සංවධර්න නියමු අදියර දැනටමත් ක්‍රියාත්මක කරන අතර, විදේශීය වෙළඳපොළ සඳහා වන නිෂ්පාදන දිරිගන්වමින් සංවධර්න හවුල්කරුවන්ගේ සහයෙන් මෙම වැඩසටහන තවදුරටත් පුළුල් කිරීම ද අපේක්ෂා කෙරේ. | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන ඇති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එහෙත් එම ඉල්ලීම 2023 පෙබරවාරි 10 දින කෘෂිකමර් දෙපාතර්මේන්තුව වෙත මාරු කර යවන ලද අතර ඉන් පසු ඒ සඳහා තොරතුරු කිසිවක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | කෘෂිකමර් දෙපාතර්මේන්තුව |
| දේශගුණික අරමුදල සමඟ එක්ව දේශගුණික බලපෑම් අවම කිරීමේ වැඩසටහන | ශ්‍රී ලංකාවේ කාලගුණය සහ දේශගුණය ආශ්‍රිත බලපෑම් හේතුවෙන් අනතුරු, ආපදා සහ දේපළ හානි වැඩි වීමේ ප්‍රවණතාවක් පවතින බැවින් දේශගුණික බලපෑම් අවම කිරීමට සුදුසු පියවර කඩිනමින් ගත යුතු ය. ඒ සඳහා පරිසර විෂය භාර අමාත්‍යාංශය සුදුසු වැඩපිළිවෙළක් සකස් කර දේශගුණික අරමුදලෙන් අවශ්‍ය සහය ලබාගත යුතු අතර ඒ අනුව එම බලපෑම් අවම කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය. | **සාධනීය**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට 2023 මාර් 08 දිනැති ප්‍රතිචාරයක් ලැබිණි. සැපයූ තොරතුරු ප්‍රගතිය ඇගයීමට අදාළ විය. | **දුවර්ලයි**<br>ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් තොරතුරු දැනගැනීමේ ඉල්ලීමට ලබා දුන් ප්‍රතිචාරයට අනුව ව්‍යාපෘතිය උපායමාගර්කව සකස් කර ඇති අතර ඉලක්ක ද සකස් කර ඇත. කෙසේ වෙතත් ඉදිරිපත් කර ඇති තොරතුරුවලින් පෙනී යන්නේ යෝජනාව සැබවින්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ලබා නොමැති බවයි. | පරිසර අමාත්‍යාංශය |

| | | ආවෘත | හෙළිදරව් කර නොමැත | |
|---|---|---|---|---|
| විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) විෂයයන් කෙරෙහි අවධානය යොමු කරමින් ශාඛා විශ්ව විද්‍යාල පිහිටුවීම | ලෝකයේ බොහෝ රටවල් තම විදේශ සංචිත ගොඩනැඟීම සඳහා විදේශ සිසුන්ට අධ්‍යාපන අවස්ථා විවෘත කර ඇත. දකුණු ආසියානු කලාපයේ, බංග්ලාදේශය, ඉන්දියාව සහ නේපාලය දැනටමත් ඔවුන්ගේ විදේශ සංචිත ගොඩනැඟීම සඳහා විදේශීය සිසුන්ට තම රටවල් විවෘත කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව ද විදේශීය සිසුන්ට අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා පෞද්ගලික ආයෝජන දිරිමත් කළ යුතුව ඇත. එබැවින්, විශේෂයෙන් විද්‍යාව, තාක්‍ෂණය, ඉංජිනේරු සහ ගණිතය (STEM) විෂයයන් මෙන්ම මූල්‍ය, තොරතුරු තාක්‍ෂණය සහ වෛද්‍ය විද්‍යාව කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව තුළ ශාඛා විශ්ව විද්‍යාල පිහිටුවීමට පහසුකම් සලසන මෙන් මම යෝජනා කරමි. මේ සඳහා, සමාගම් පනතේ සහ විශ්ව විද්‍යාල පනතේ දක්වා ඇති විධිවිධාන අනුව සහ අවශ්‍ය අවස්ථාවලදී ඒවා සංශෝධනය කිරීමට යටත්ව අදාළ අනෙකුත් නීතිමය ප්‍රතිපාදන අනුව එවැනි ශාඛා විශ්ව විද්‍යාල පිහිටුවීම සඳහා රජය ආයෝජන මණ්ඩලය (BOI) හරහා සියලු පහසුකම් සපයනු ඇත. උසස් අධ්‍යාපනයට අදාළව පෞද්ගලික ආයෝජන සඳහා | තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | අධ්‍යාපන අමාත්‍යාංශය/<br>ආරක්ෂක අමාත්‍යාංශය/ |

| | | | | |
|---|---|---|---|---|
| | ඉඩ ලබා දීම මගින් රාජ්‍ය සම්පත් ඒ වෙත යොමු කිරීමට ඇති අවශ්‍යතාව අඩු වන අතර එමගින් නිදහස් අධ්‍යාපනය සුරැකී වත්මන් මට්ටම අභිබවමින් එව පුළුල් වන බව තහවුරු කිරීමට රජයට හැකි වනු ඇත. මෙම විශ්ව විද්‍යාලවල ඉගෙනීම සඳහා ශ්‍රී ලාංකික සිසුන්ට ශිෂ්‍යත්ව ද ලබා දෙනු ඇත. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ (KDU) ශාඛාවක් කුරුණෑගල විවෘත කරන ලෙස ද මම යෝජනා කරමි. | | | |
| වැඩිහිටියන් සඳහා දීමනාව | වැඩිහිටියන් සඳහා දීමනාව දැනට ලැබෙන සහනය - අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන්ට රු. 2,000/- ක මාසික දීමනාවක් සහ වයස අවුරුදු 100 ට වැඩි අයට රු. 5,000/- ක මාසික දීමනාවක්. මීළඟ මාස 04 සඳහා යෝජිත දීමනාව - අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන්ට රු. 3,000/- ක මාසික දීමනාවක් සහ වයස අවුරුදු 100 ට වැඩි වැඩිහිටයන් සඳහා රු. 2,500/- ක මාසික දීමනාවක් | **ආවෘත** | **හෙළිදරව් කර නොමැත** | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය |
| | | තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත. ජාතික අයවැය දෙපාතර්මේන්තුව විසින් හඳුනාගෙන තිබූ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත 2023 පෙබරවාරි 01 දින තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. එනමුත් එම ඉල්ලීම මාරු කර යවන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | |
| රජයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ප්‍රජා ඒකක පිහිටුවීම | නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන්ගේ බොහෝ දෙනෙක් ක්ෂුද්‍ර පරිමාණ ස්වයංරැකියා / ජීවනෝපාය රැකියාවල නිරත වෙති. මෙම ප්‍රජාවට ජීවන වෘත්තීන් සඳහා තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ අධර්කාලීන හෝ කෙටිකාලීන විධිමත් පුහුණුවක් ලබා දීමෙන්, එම රැකියාවල ඵලදායිතාව, | **ආවෘත** | **හෙළිදරව් කර නොමැත** | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | තොරතුරු මාගර්ගත ලෙස ක්‍රියාශීලීව හෙළිදරව් කිරීමක් නොමැත. 2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | |

| | | | | |
|---|---|---|---|---|
| | ආරක්ෂාව සහ සෞඛ්‍යය වැඩි වන අතර නිෂ්පාදනවල ගුණාත්මකභාවය ද ඉහළ යනු ඇත. මේ සඳහා රජය යටතේ ක්‍රියාත්මක වන සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකම ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ප්‍රජා ඒකකයක් ස්ථාපිත කිරීමට යෝජිත අතර පුහුණු මධ්‍යස්ථානයේ නොමැති තාක්ෂණික සේවාවන් බාහිරින් ලබාගෙන එම ප්‍රජාවට පුහුණු පහසුකම් ලබාදීමට ද යෝජනා කර ඇත. ඒ අනුව පුහුණු මධ්‍යස්ථානය ආශ්‍රිත ජීවනෝපාය ලෙස ආහාර පාන සැකසීම, මාළු වියළීම සහ එළවලු විජලනය, මැහුම් ගෙතුම්, බීරළු විවීම, පිත්තල කර්මාන්තය, කම්මල් වැඩ, ගිග් ආර්ථිකය පදනම් කරගත් මාර්ගගත ස්වයංරැකියා සහ වෙනත් ජීවන වෘත්තීන් සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබාදීමට කටයුතු සිදු කෙරෙමින් පවතී. පුහුණුව අවසානයේදී සහතිකයක් ද ලබා දෙනු ඇත. විධිමත් පුහුණුවෙන් පසු දැනට නියැලී සිටින වෘත්තිය ඵලදායි ලෙස හා කාර්යක්ෂමව කළ හැකි බැවින් ආහාර සහ අනෙකුත් නිෂ්පාදන ගුණාත්මකව ලබා දිය හැකි වනු ඇත. එමගින් ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කළ හැකි වන අතර ඔවුන්ගේ ව්‍යාපාර වැඩි දියුණු කිරීමට ද හැකියාව ලැබේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 200 ක් වෙන් කරමි. | | | |

| | | | | |
|---|---|---|---|---|
| දුම්රිය සේවයේ ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පුද්ගලික ආයෝජනය | කාර්යක්ෂම සහ උසස් තත්ත්වයේ ප්‍රවාහන සේවාවක් ජනතාවට ලබාදීම රජයේ ප්‍රමුඛ කාර්යයක් වන බැවින් දැනට පවතින යටිතල පහසුකම් මෙම වැඩසටහන යටතේ යොදා ගනිමින් දුම්රිය ප්‍රවාහන සේවයේ දියුණුව සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, නියමු ව්‍යාපෘතිය ලෙස කැළණිවැලි දුම්රිය සේවය සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.<br>මෙහිදී ආයෝජකයා(යින්) තෝරීම තරඟකාරී ලංසු ක්‍රියාවලියක් මත පදනම්ව සිදු<br><br>ඇත. | **ආවෘත**<br><br>තොරතුරු මාගර්ගත ලෙස ප්‍රගාමීව හෙළිදරව් කර නොමැත.<br>2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br><br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | දුම්රිය දෙපාතර්මේන්තුව |

| යෝජනාව/ අමාත්‍ය මණ්ඩල තීරණය | යෝජනාවේ විස්තර | විවෘතභාවය | ප්‍රගතිය | රජයේ නියෝජිතායතනය |
|---|---|---|---|---|
| ආයතනික පාලනය ශක්තිමත් කිරීමට සහ දූෂණයට එරෙහිව සටන් කිරීමට පුළුල් රාමුවක් | ආයතනික පාලනය ශක්තිමත් කිරීමට සහ දූෂණයට එරෙහිව සටන් කිරීමට පුළුල් නෛතික රාමුවක් ස්ථාපිත කෙරෙනු ඇත. | **සීමිත**<br>සීමිත තොරතුරු ප්‍රමාණයක් ප්‍රගාමීව මාගර්ගතව හෙළිදරව් කර තිබේ. 2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **(ක්‍රියාත්මක කර නොමැත)**<br>ප්‍රගාමීව හෙළිදරව් කර ඇති තොරතුරුවලට අනුව, පාලර්මේන්තුවට වගකියන අල්ලස් හා දූෂණ පිළිබඳ ස්වාධීන විමශර්න කොමිෂන් සභාවක් පිහිටුවීම ද ඇතුළු කොට ගත් දූෂණ විරෝධී පනත් කෙටුම්පතක් පාලර්මේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. | නීතිපති දෙපාතර්මේන්තුව |
| වත්කම් ප්‍රකාශ කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම | මෙම රාමුව මගින් වත්කම් ප්‍රකාශ කිරීමේ පද්ධතිය ශක්තිමත් කරනු ලබන අතර අල්ලස් හෝ දූෂණ චෝදනා විමශර්න කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ඉහළ නංවනු ඇත. | **ආවෘත**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත.<br>2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>යෝජනාවේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි කිසිදු තොරතුරක් නොලැබුණු අතර අන්තජර්ාලයේ ද පළ කර නොතිබිණි. | නීතිපති දෙපාතර්මේන්තුව |
| අල්ලස් හෝ දූෂණ චෝදනා විමශර්න කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ඉහළ නැංවීම | තව ද, දූෂණයට තුඩු දෙන කාරණා තුරන් කිරීම සහ විනිවිදභාවය ඇති කිරීම සඳහා තාක්‍ෂණය මුසු පද්ධතීන් ප්‍රවධර්නය කිරීමට මම යෝජනා කරමි. | **සීමිත**<br>සීමිත තොරතුරු ප්‍රමාණයක් ප්‍රගාමීව මාගර්ගතව හෙළිදරව් කර තිබේ. 2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. | **(ක්‍රියාත්මක කර නොමැත)**<br>ප්‍රගාමීව හෙළිදරව් කර ඇති තොරතුරුවලට අනුව, පාලර්මේන්තුවට වගකියන අල්ලස් හා දූෂණ පිළිබඳ ස්වාධීන විමශර්න කොමිෂන් සභාවක් පිහිටුවීම ද ඇතුළු කොට ගත් දූෂණ විරෝධී පනත් කෙටුම්පතක් පාලර්මේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. | නීතිපති දෙපාතර්මේන්තුව |
| දූෂණයට තුඩු දෙන කාරණා තුරන් කිරීම සඳහා තාක්‍ෂණය මුසු පද්ධතීන් ප්‍රවධර්නය කිරීම | තව ද, දූෂණයට තුඩු දෙන කාරණා තුරන් කිරීම සහ විනිවිදභාවය ඇති කිරීම සඳහා තාක්‍ෂණය මුසු පද්ධතීන් ප්‍රවධර්නය කිරීමට මම යෝජනා කරමි. | **උදාසීන**<br>තොරතුරු ප්‍රගාමීව මාගර්ගත ලෙස හෙළිදරව් කර නොමැත. 2023 පෙබරවාරි 01 දින ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලද අතර 2023 මාතර්ු 03 ඊට ප්‍රතිචාරයක් ලැබිණි. | **හෙළිදරව් කර නොමැත**<br>ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් සපයන ලද තොරතුරුවලට අනුව, ""වත්කම් ප්‍රකාශ කිරීමේ මධ්‍යගත විද්‍යුත් පද්ධතියක් ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමශර්න කොමිෂන් සභාවේ විමශර්නවලට අදාළ ලිපිගොනුවල සංචලනය සම්බන්ධයෙන් පරිගණකගත දත්ත ගබඩාවක් ස්ථාපනය කිරීම" යන මැයෙන් පළ කර ඇති සංකල්ප පත්‍රිකාවක් හරහා අපේක්ෂිත ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරී සැලැස්මක් සපයන ලදි. කෙසේ වෙතත් මෙම ප්‍රතිචාරය මගින් යෝජනාව සැබවින්ම කෙතරම් දුරට | අල්ලස් හෝ දූෂණ චෝදනා විමශර්න කොමිෂන් සභාව/ තාක්ෂණ අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| | | | ක්‍රියාත්මක කර ඇත් ද යන්න පිළිබඳව කිසිදු තොරතුරක් ලබා නොදුන් බැවින් ඒ සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කිරීමට නොහැකි විය. | |
| ව්‍යාපෘති කාර්යාල සහ ව්‍යාපෘති ඒකකවල ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීමේ කමිටුව | විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති කාර්යාල සහ ව්‍යාපෘති ඒකකවලට සැලකිය යුතු කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් සහ ඉහළ ගෙවීම් ප්‍රමාණයක් ඇතුළත් වන බැවින් ඒවායේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම වැදගත් වේ. එබැවින් එම කාර්යාල සහ ඒකකවල අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේ ද යන්න සහ එම ආයතන අඛණ්ඩව පවත්වාගෙන යාම අවශ්‍යය ද යන්න සමාලෝචනය කර මාස 3ක කාලයක් තුළ අමාත්‍ය මණ්ඩලයට නිදෙර්ශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කිරීමට මම යෝජනා කරමි. | **විවෘත**<br>අමාත්‍ය මණ්ඩල තීරණයක් හරහා තොරතුරු ප්‍රගාමීව හෙළදරව් කරන ලදි. | **ක්‍රියාත්මක කර ඇත**<br>ප්‍රගාමීව හෙළිදරව් කරන ලද තොරතුරුවලට අනුව:<br>- රජයේ විවිධ ව්‍යාපෘති සහ B11 වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහ ඊට පහසුකම් සැලසීම පිණිස ව්‍යාපෘති කාර්යාල (POs) සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMUs) සමාලෝචනය කිරීමේ කමිටුව පත් කළ බව 2022.09.06 දින ජනාධිපති මාධ්‍ය අංශය නිවේදනය කළේය. කේ.ටී. කමල් පද්මසිරි කමිටුවේ සභාපති ලෙස පත් කරන ලද අතර එන්.කේ.ජී.කේ නෙම්මාවත්ත සහ ආර්.එච් රුවිනිස් අනෙකුත් කමිටු සාමාජිකයින් ලෙස පත් කරන ලදී. කමිටුවේ නිදෙර්ශ ඇතුළත් වාර්තාව 2022.11.15 දිනට පෙර ඉදිරිපත් කිරීමට නියමිතය.<br>- යෝජිත කමිටුව පත්කිරීමෙන් පසු එහි කාර්යයන් තවදුරටත් පැහැදිලි කරන ලදි. පහත කරුණු විමශර්නය කිරීමේ කාර්යය කමිටුවට පවරන ලදි: 1) ව්‍යාපෘති කාර්යාල/ව්‍යාපෘති කළමනාකරණ ඒකක හරහා සිදු කෙරෙන කාර්යයන් අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු/ආයතනය යටතේම ඉටු කළ හැකි ද යන්න 2) ව්‍යාපෘති කාර්යාල සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත පවරා ඇති අදාළ කාර්යයන් ඉටු කර තිබේ ද යන්න 3) ව්‍යාපෘති කාර්යාල/ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් ඉටු කරන කාර්යයන්ගේ ස්වභාවය සැලකූ විට ඒවා එලෙසම පවත්වා ගෙන යා යුතු ද යන්න 4) ව්‍යාපෘති කාර්යාල සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල අතිරික්ත කාර්ය මණ්ඩල සිටිත් ද යන්න 5) වෙනත් ඊට සම්බන්ධ කරුණු තිබේ නම්.<br>- 2023.02.06 දින ගත් අමාත්‍ය මණ්ඩල තීරණයකින් පෙනී යන්නේ, දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති කළමනාකරණ ඒකක 55ක් වසා දැමීමටත්, තවත් ව්‍යාපෘති කළමනාකරණ ඒකක 32ක් අත්හිටුවීමටත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකක 46ක් අවම කාර්ය මණ්ඩලයක් යටතේ පවත්වාගෙන යාමටත් සුදුසු බව එම කමිටුව නිදෙර්ශ කළ බවයි. ඒ අනුව, වාර්තාවේ සඳහන් නිදෙර්ශ ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වශයෙන් ගරු ජනාධිපති විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |

## වගකීම්හරණය

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු රජයේ වාතර්ා, නිල ප්‍රකාශන, මහජන වාතර්ා සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් ඔස්සේ ලැබෙන තොරතුරු ඇසුරින් සම්පාදනය කර ඇත. මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු වෙරිටේ රිසච් ආයතනයේ හෝ එහි සාමාජිකයින්ගේ හෝ පෞද්ගලික අදහස් හෝ මතය පිළිබිඹු නොකරයි. වේදිකාවේ ඇතළත් තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි හෝ එසේ වූ බවට කියැවෙන කිසිදු අලාභයකට හෝ කීතර්ී නාමයට හානි කිරීම ඇතුළුව කිසියම් අලාභයක් හෝ හානියක් සඳහා වෙරිටේ රිසච් ආයතනය කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ.

මෙම වේදිකාවේ පළ කර ඇති තොරතුරු විශ්වාසදායක ප්‍රභවයන්ගෙන් ලබාගෙන ඇති බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර, තොරතුරුවල ඇති කිසිදු දෝෂයකට, මගහැරීමකට හෝ එම තොරතුරු භාවිතයෙන් ලබාගත් ප්‍රතිඵල සඳහා හෝ වෙරිටේ රිසච් සහ budgetpromises.org කණ්ඩායමෙහි සාමාජිකයින් වගකිව යුතු නොවේ. වෙරිටේ රිසච් ආයතනයේ පූවර් ලිඛිත අවසරයකින් තොරව මෙම වේදිකාවේ අන්තගර්තයන් වෙනස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම, සම්ප්‍රේෂණය කිරීම, හුවමාරු කිරීම, විකිණීම, පිටපත් කිරීම, ව්‍යුත්පන්න කෘති නිමර්ාණය කිරීම, බෙදා හැරීම, නැවත පළ කිරීම, රඟ දැක්වීම, ප්‍රදශර්නය කිරීම සහ කිසිදු ආකාරයකින් වාණිජමය වශයෙන් භාවිතා කිරීම සඳහා පරිශීලකයින්ට අවසර නොමැත.

එමෙන්ම, වෙරිටේ රිසච්හි පූවර් අවසරය ඇතිව හෝ නැතිව, පූවර්යෙන් ලබාගත් තොරතුරක් පසුකාලීනව භාවිතා කිරීමෙන් උද්ගතවන ප්‍රතිඵල සඳහා budgetpromises.org වගකිව යුතු නොවේ.

budgetpromises.org කිසිදු දේශපාලන පක්ෂයක් සහ / හෝ දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත සංවිධානයක් වෙත සහය දැක්වීම, අනුමත කිරීම, නියෝජනය කිරීම සහ ඒ සමඟ සම්බන්ධ වීම ආදිය සඳහා කටයුතු නොකරයි. විශ්ලේෂණ සඳහා භාවිතා කෙරෙන දශර්ක හුදෙක් කායර් සාධනයේ සංඛ්‍යානමය අනුමානයන් පමණකි.

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු පරිශීලකයින් දැනුවත් කිරීම සඳහා නොමිලයේ  සපයනු ලැබේ. එම තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වෙරිටේ රිසච් හෝ budgetpromises.org කණ්ඩායමේ සාමාජිකයින් සහ කිසියම් පරිශීලකයෙකු අතර එකඟතාවයක් හෝ අවබෝධතාවක්  නොපවතී.

මෙම වේදිකාව, දත්ත මගින් ප්‍රදශර්නය කෙරෙන ප්‍රවණතා දැක්වීමට සහ ඒවා පිළිබිඹු කිරීමට budgetpromises.org විසින් සකස් කරන ලද ස්වාධීන විශ්ලේෂණ ලිපිවලින් සමන්විත වේ. එවැනි විශ්ලේෂණ ලිපි පිටපත් කිරීම වෙරිටේ රිසච් හි පූවර් අවසරය ඇතිව සිදු විය යුතුය.